

# අඹවෙල කිරි පට්ටිය

මෙවර අපේ ගමන වූයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි අඹවෙල කිරි පට්ටියටය. මුහුදු මට්ටමෙන් අඩි 6000 ක් උසින් පිහිටි මෙම ගොවිපල ආරම්භ කරන ලද්දේ ලංකාවේ ප්‍රථම අගමැති දිවංගත ඩී. ඇස්. සේනානායක මහතා විසින් දෙවැනි ලෝක සංග්‍රාමයේදීය. යුරෝපීය කිරි හරක් නඩත්තුවට අතිශයෙන් යෝග්‍ය දේශ ගුණයක් ඇති මෙම ප්‍රදේශයේ ස්වාභාවික තණබිම් වලින් ප්‍රයෝජන ගෙන ඉහල පෙලේ කිරි හරක් මෙරට බෝ කිරීමට ගත් ප්‍රථම උත්සාහය ක්‍රියාත්මක වූයේ, බෝපත්තලාව සහ අඹවෙල කිරි පට්ටි ආරම්භ කිරීමෙනි.

අඹවෙල කිරිපට්ටිය පිහිටියේ නුවර එළිය අසල ඇති හක්ගල කන්ද පාමුලය. නානුඔය, නුවරඑළිය මහා මාර්ගයේ බ්ලැක් පූල් නමැති ස්ථානයෙන් හැරී කන්දේ ඇල, වැව පසුකර සුළු ප්‍රමාණයක් යැමෙන් ගොවිපලට ළඟා විය හැක. කිරිපට්ටිය අඹවෙල දුම්රිය ස්ථානයටද ඉතා නුදුරින් පිහිටි නිසා ගමන් මාර්ග එමටය.


මෙරට කඳුකර පළාත්වලට යෝග්‍ය කිරි හරක් බෝ කිරීම සඳහා නියමිත මේ ගොවිපලේ කාර්ය මාලාව මෙසේය. අයර්ෂයර් නමැති යුරෝපීය කිරි හරක් වර්ගය බෝකර රජයේ ප්‍රයෝජනයට සහ මහජනයාට ඇති කිරීම සඳහා සතුන් සැපයීමට මින් මුල් ස්ථානය ගනී. මෙරට උඩරට පෙදෙසට යෝග්‍යවන පරිදි බෝකරන මෙම හරකුන්ගේ කිරි නිෂ්පාදන ශක්තිය තව තවත් බෝ කිරීමෙන් නගාලීම රජයේ විශෙෂ පරිශ්‍රමය වේ. උඩරට දේශ සීමාවන්හි ඇති ස්වාභාවික තණබිම් වලින් ප්‍රයෝජන ගැනීම හා දියුණු තෘණ වර්ග වගා කිරීමෙන් තණබිම් වල පෝෂ්‍ය භාවය වැඩි කිරීමද මෙම කාර්ය මාලාවේ දෙවැනි තැන ගනී. මේ අතර අඹවෙල ගොවිපල ආදර්ශමත් කිරිපට්ටියක් සේ දියුණු

කර මෙවැනි දෙශ **සීමාවන්හි කිරි හරකුන්** නඩත්තුවෙහි හා ආහාර සැපයීමෙහි ඇතිවෙන ගැටලු විසඳීමද නව විශෙෂාංගයක් වේ. වඩාත් කිරි නිෂ්පාදනය කිරීමෙන් මෙවැනි ගොවිපල් සාර්ථකව හා ආර්ථිකව නඩත්තු කළ හැකි බව මහජනයාට පෙන්වා දීමද රජයෙන් අදහස් කෙරේ.

අඹවෙල කිරි පට්ටියේ නිපදවෙන කිරි දුම්බර, හාරිස්පත්තුව, දෙනුවර, තුම්පනේ ආදී පෙදෙස්වල කිරි මධ්‍යස්ථානවලට යවනු ලැබේ. කිරි පට්ටියට නියමිත කාර්‍ය මාලාවට මෙය අයිති නුවූවත් මෙම කාර්‍යයෙන් මෙරට ළදරුවන්ට වටිනා සෙතක් ගෙන දේ. නුවරඑළිය, හපුතලේ හා බදුල්ලේ පිහිටි ආරෝග්‍යශාලාවලට ද මෙම කිරි සපයන අතර ඉතිරි ප්‍රමාණය කොළඹ කිරි මණ්ඩලයට යැවේ. කිරි සුරක්ෂිතව තැබීම සඳහා ඉහතින් සඳහන් ස්ථානවලට යැවීමට ප්‍රථම කිරි සියල්ල පැස්ටර් කරනු ලැබේ. මේ සඳහා ගොවිපලේ සවිකර ඇති පැස්ටර් කාරක ද ඉතා නවීන යන්ත්‍ර බව මෙතැන්හිදී සඳහන් කිරීම යෝග්‍ය වේ.

අයර්ෂයර් නමැති කිරි හරක් බෝ කරන මෙම කිරි පට්ටියේ දැනට කිරි ගන්නා දෙනුන් 153 ද, කිරි වැරූ දෙනුන් 53 ද, පුන් ගවයන් 13 ද සම්පූර්ණ සතුන් ගණන වූ 545 ට අඩංගු වේ. කිරි දෙනුන්ගේ උසස් නිෂ්පාදනය, දිනකට දෙවරක් දෙවීමෙන් ලබා ගන්නා කිරි පයින්ට් 2600 න් පැහැදිලි වේ. මේ අතර කිරි පයින්ට් එකක් නිපදවීමට වැයවන සත —/36½ සුළු ලෙස සැලකුව හැක. කිරි දෙනුන්ට ආහාර වශයෙන් සපයන පෝෂ්‍ය ආහාර ප්‍රමාණය වැඩි කර සාන්ද්‍ර ආහාර අඩු කිරීමෙන් මෙම මුදල තව තවත් පහත් කිරීමට විධි විධාන යොදා තිබේ.


අඹවෙල ගොවිපලේ ඉහල පෙලේ කිරි හරක් බෝ කිරීමේ ව්‍යාපාරය ඉතා සාර්ථකව ඉටුවන බව පෙනෙන්නේ ප්‍රින්සස් නමැති දෙනගෙනි. අවුරුදු ගණනාවක ක්‍රමානුකූල බෝ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, අග්නිදිග ආසියාවේ කිරි නිෂ්පාදනයේ ප්‍රමුඛස්ථානය දින 305 ක කිරි මුරයකින් රාත්තල් 15,400 ක් නිපදවීමෙන් ලබා ගත්තේ මේ දෙනය.



**දිනකට කිරි පයින්ට් 60 ක් දෙන ප්‍රින්සස් නමැති දෙන.**

විශාල කිරි බුරුල්ලක් ඇති, ශාන්ත පෙනුමෙන් යුත් මෙම දෙන දිනකට තෙවරක් කිරි දෙවිය යුතු කිරි නිපදවන යන්ත්‍රයකි. ආහාර වශයෙන් ගන්නා පෝෂ්‍ය හා සාන්ද්‍ර කෑම කිරි ලෙස මනාව පරිවර්තනය කරණ මැ දිනකට නිපදවන කිරි ප්‍රමාණය කිරි පයින්ට් 60 ක් බව ඇසූ අපි විශ්මයට පත්වීමු. එළදෙන ශරීරයෙන්ද අති විශාල වූහ. බුරුල්ලේ විශාලකම අධික නිසා ඇයට තණබිම්වල සංචාරය පවා නොහැකි හෙයින් ආහාර සැපයීම අත් කෑම වශයෙනි. දිනකට තෙවරක් කිරි ගන්නේ කිරි වැඩියෙන් ලබා ගැනීමට පමණක් නොව එළදෙනටද කිරි බර බුරුල්ලෙන් නිදහසක් දීම පිණිසය. ප්‍රින්සස් නමැති දෙන අහම්බෙන් සොයා ගත් සතෙක් නොව, මැ කිරි නිපදවීමේ ශක්තිය සහජයෙන්ම ඇති පරපුරක අතිජාත වැස්සියකි. අඹවෙල ක්වීන් නම් ඇගේ මව දින 305 ක කිරි මුරයකදී රාත්තල්, 13,835 නිපදවූ අතුල්‍ය කිරි දෙනකි. ක්‍රමානුකූලව කිරි දෙනුන් බෝ කිරීමේ ප්‍රගමනය පෙන්වන අතර, ප්‍රින්සස් වැනි දෙනුන් වඩ වඩාත් ඇති කිරීමය මේ ගොවිපලේ විශෙෂ ප්‍රයත්නය.


අඹවෙල කිරි පට්ටියේ අනික් ස්වරූපය වූ, උඩරට ස්වාභාවික තණබිම්වල දියුණු යුරෝපීය තණ වර්‍ග වැඩි වැඩියෙන් වගා කිරීමේද, විශෙෂ දියුණුවක් ලබා තිබේ. ගොවිපලට අයිති අක්කර 1,200 ක් පමණ බිම්



කිරි දෙවීමට පෙර ගාල

ප්‍රමාණය මුලදී පතානවලින් හා කැලෑ වලින් සමන්විත වූහ. ස්වාභාවික තණබිම් වූ පතාන වල පමණක් නොව කැලෑද එලිකර කිකියු නමැති වටිනා යුරෝපීය තණ වර්ගයෙන් දැනටද විශාල ඉඩම් ප්‍රමාණයක් සාර්ථකව වගාකර තිබේ. අඹවෙල කිරි පට්ටියට අඩුවක් වශයෙන් තිබෙන්නේ ස්ථාවර ජල මාර්ගයක් නොමැති වීමය. එසේ වීද ගොවිපලේ තණ වගාවේ ප්‍රගමනය සැලකිය යුතුය. කිරි පට්ටියට අයිති සම්පූර්ණ ප්‍රමාණය කිකියු නමැති තණවලින් වගා කර සමාප්ත වූ විට එහි නිපදවෙන කිරිවල ප්‍රමාණය බෙහෙවින් වැඩි වී, කිරි පයින්ටුවක් නිපදවීමේ මිලද සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවෙනවා ඇත. එය එසේ වන්නේ කිරි දෙනුන්ට සපයන සාන්ද්‍ර ආහාර අඩු කර පෝෂ්‍ය ආහාර වැඩි කිරීමෙන් ය. කිරි පට්ටියක දියුණුව ඇතිවීමට සපයන ආහාරවල ප්‍රමාණය හා තත්ත්වය විශේෂ ස්ථානයක් ගන්නා නිසා මෙම ගොවිපලේ තණ වගාව ගැන රජය එතරම් උත්සාහයක් දැරීම පුදුමයක් නොවේ.

මහජනයාට විශේෂ සේවයක් සේ තෝරා ගත් පරපුරකින් පැවත එන ගොන් වස්සන් සැමවිට විකිණීමටද මෙහි සිටී. එහි ප්‍රතිඵල යක් වශයෙන් උඩරට පළාත්වල පෞද්ගලික කිරි පට්ටි කරුවන්ගෙන් වස්සන් ඉල්ලීම් බෙහෙවින් තිබේ.



කිරි කාමරය



සාරවත් කිකියූ වගාවක්

ඉහතින් සඳහන් අයර්ෂයර් හරක් වර්ගය හැර ලාර්ජ් බ්ලැක්ස් ඌරන් 150 ක් සමන් විත ඌරු ගාලක් ද ගොවිපලට තිබේ. ගවගාලේ ඉතිරිවන ආහාර ද්‍රව්‍ය වලින් ප්‍රයෝජනයක් ගැනීම පිණිස ඌරන් ඇති කිරීම අඹෙවල කිරි පට්ටියේ අතිරේක ව්‍යාපාරයක් වේ. බෝ කිරීම සඳහා පැටවුන් ගොවිපලෙන් මහජනයාට අලෙවි කරන අතර, ඉතිරි පැටව් තරකර විකිණීම සඳහා වැලිසර රජයේ ගොවිපලට යවනු ලැබේ. අඹෙවෙල ගොවිපලෙන් දිවයිනේ සත්ව නිෂ්පාදනය දියුණු කිරීමට වටිනා රුකුලක් ලැබෙන බව මේ කරුණු වලින් මොනවට පැහැදිලි වේ.